# දකුණු පළාත් සභාව

## දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය

**(ද.ප. ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය)**

# කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරියේ පහත තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම වෙනුවෙන් පහත සඳහන් සුදුසුකම් ලත් දකුණු පළාතේ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ගණකාධිකාරී (කොන්ත්‍රාත්) - 01

**1.1 සුදුසුකම්**

1.1.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂ උපාධියක් (ගිණුම්කරණය / ගණකාධිකරණය / වාණිජ්‍ය විෂයයකින්) ලබා තිබීම

සමග

ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

1.1.2 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතිකලත් සංස්ථාපිත ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) මධ්‍යම මට්ටමේ (Intermediate) සුදුසුකම්

සමග

ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

1.1.3 විෂය ක්ෂේත්‍රයට අදාළ (ගණකාධිකරණ) රජයේ දීප ව්‍යාප්ත සේවාවන් වල III/II හෝ ඊට ඉහළ පන්තියකට අයත් විශ්‍රාමික නිලධාරියකු වීම

සමග

III/II වන පන්තියේ විෂය ක්ෂේත්‍රයට අදාළ (ගණකාධිකරණ) තනතුරක අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද ලබා තිබීම.

**1.2 වයස -** අවු. 45 ට නොඅඩු හා අවු. 65 ට නොවැඩි.

**1.3 වැටුප -** JM 1-1 රු. (42,600 x 10 x 755 - 18 x 1,135 - 70,580) සහ රජය විසින් අනුමත අනෙකුත් දීමනා.

## 02. පිළිගැනීමේ නිලධාරී (කොන්ත්‍රාත්) - 01

**2.1 සුදුසුකම්**

2.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍යපෙළ) විභාගයේදී

I. සිංහල
II. ගණිතය
III. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් (04) කට සම්මාන සාමාර්තයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබීම

**2.2 වයස -** අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි

**2.3 වැටුප -** MA 1-1 - රු. (27,910-10 x 300 - 7 x 350 - 4 x 495 - 20 x 660 - 48,540)

## 03. කම්කරු (කොන්ත්‍රාත්) - 02

**3.1 සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම.

**3.2 වයස -** අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි.

**3.3 වැටුප -** PL-1 - රු. (24,750 - 10 x 250 - 10 x 270 - 7 x 300 - 15 x 330 - 37,000)

**04. පොදු කොන්දේසි**

ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට, පූර්වාසන්න කාලයේ අවම වශයෙන් වර්ෂ තුනක් (03) වත් දකුණු පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**05. පත්වීමේ ස්වභාවය**

එක් වසරක කාලසීමාවකට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන අතර, තනතුරේ අවශ්‍යතාවය හා සතුටුදායක කාර්ය සාධනය මත පදනම්ව සේවයේ දීර්ඝ කිරීම සලකා බලනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත වේ.

**06. තෝරා ගැනීමේ ක්‍රමවේදය**

පත්වීම් බලධරයා විසින් පත් කරන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

සම්පූර්ණ විස්තර සහිතව ඔබ විසින් සකස් කරන ලද ජීව දත්ත සහිත අයදුම්පත් (සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්ද සහිතව) 2021.08.13 දින හෝ ඊට ප්‍රථම **"සභාපති, ද. ප. කාර්මික සංවර්ධන අධිකාරිය, අංක 349 1/2, මාතර පාර, කටුගොඩ, ගාල්ල"** යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ. ඉහත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ හා නියමිත පරිදි නියමිත දිනට ඉදිරිපත් නොකරන හා අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**ද.ප. කාර්මික සංවර්ධන අධිකාරිය.**

Source: Dinamina (2021.07.28)